# යුරෝපා සංගම් මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම, ශ්‍රී ලංකාවේ අනාගත මැතිවරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම උදෙසා නිර්දේශ 16 ක්ද ඇතුලත්ව සිය අවසන් වාර්තාව එළිදක්වයි.

*වහා පලකිරීම පිණිස*

**2025 ජනවාරි 17, කොළඹදී –** යුරෝපා සංගමයේ ශ්‍රී ලංකාව සඳහා වන මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම විසින් 2024 සැප්තැම්බර් 21 වන දින පැවති ජනාධිපතිවරණය පිළිබඳ ඔවුන්ගේ අවසාන වාර්තාව අද දින පළ කරන ලදී. මෙම වාර්තාව දෙමසක් පුරා දිවයිනම ආවරණය වන පරිදි දියත් කරන ලද නිරීක්ෂණ වල ප්‍රතිඵලයක් වන අතර සමස්ත මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විස්තරාත්මක විශ්ලේෂණයක් සහ ඇගයුමක් ඉදිරිපත්කරයි.

මෙම වාර්තාවේ කොටසක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් සහතික කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තරව බැඳී සිටින කාරණාද ආවරණය කරමින් ඉදිරි මැතිවරණ ක්‍රියාවලි ශක්තිමත් කිරිමට හා දියුණු කිරීම සඳහා උපකාර වන නිර්දේශ 16ක් ඉදිරිපත් කරයි.

*“2024 ජනාධිපතිවරණය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ අතර පෙර නොවූ විරූ කැළඹිලි කාලයකින් පසුව ගතානුගතික දේශපාලන තත්ත්වය අලුත් කිරීමක් දක්නට ලැබුනා. පුරවැසියන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ කැපවීම පෙන්නුම් කළ අතරම , ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව ස්වාධීනව සහ අධිෂ්ඨානශීලීව මැතිවරණ ක්‍රියාවලියේ සියලු ප්‍රධාන අවස්ථා වලදී විනිවිදභාවය සහතික කරමින් කටයුතු කිරීමත් අපට දක්නට ලැබුණි. සාමකාමී මැතිවරණ දිනයක් පවත්වා ගැනීම සහ අපේක්ෂකයින් විසින් මැතිවරණ ප්‍රතිඵල පිළිගැනීම ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල ශක්තිය අවධාරණය කරයි."* මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් ප්‍රධානී වූ යුරෝපා පාර්ලිමේන්තු මන්ත්‍රී, නාචෝ සන්චෙස් අමෝර් (Nacho Sánchez Amor) මෙහිදී ප්‍රකාශ කළේය.

මැතිවරණ ප්‍රචාරක පිරිවැයේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සහ ඡන්ද හිමි නාමලේඛනයට තරුණ තරුණියන් වැඩි වශයෙන් ඇතුළත් කිරීම ඉලක්ක කරගත් සුවිශේෂී ප්‍රතිසංස්කරණ ඇතුළුව ධනාත්මක වර්ධනයන් කිහිපයක්ම නිරීක්ෂණ කණ්ඩායම විසින් සටහන් කරන ලදී. සමස්තයක් වශයෙන්, මැතිවරණ නීති රාමුව හොඳින් සංවර්ධනය වී ඇති බවත්, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සහ සිවිල් සමාජයේ සහයෝගීතාවය මැතිවරණයට ධනාත්මක දායකත්වයක් ලබා දුන් බවත් මෙහිදී නිගමනය කරයි. මැතිවරණ ව්‍යාපාරය පුරාවටම මානව නිදහසෙහි මූලිකාංග ගරුකොට සළකන ලද අතර ඡන්දදායකයින්ට තෝරා ගැනීම සඳහා සැබෑ දේශපාලන විකල්ප තිබුණි.

තවදුරටත් අදහස් දක්වමින් නිරීක්ෂක ප්‍රධානී නාචෝ සන්චෙස් අමෝර් මහතා පැවසුවේ: *" පැවති ජනාධිපතිවරණය මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිමත්බව සනාථ කළ බවත් පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු විනිවිදභාවය, අන්තර්ග්‍රහණය (සියළු දෙනා ඇතුළත් කිරීම ) සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් ජනාධිපතිවරයා සහ නව රජය තවදුරටත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනු ඇතැයි ඔවුන් බලාපොරොත්තු වන බවත්ය. පවතින සහයෝගීතාවයට අනුකූලව මෙම කටයුතු සඳහා ශ්‍රී ලංකාවට සහාය වීමට යුරෝපා සංගමය කැපවී සිටී."*. ඒ මහතා පැවසීය.

මෙම අවසන් වාර්තාව මඟින් දේශපාලනය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය අර්ථවත් ලෙස ඉදිරියට ගෙන යාම සහ රාජ්‍ය සම්පත් අවභාවිතයට එරෙහිව නීතිය බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම නිර්දේශ කරයි. ප්‍රචාරක පිරිවැයේ ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ තවදුරටත් සියුම් ලෙස සකස් කිරීමෙන් ප්‍රතිලාභ ලැබිය හැකි බව මෙහෙයුම සටහන් කරයි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ඇතුළු සීමාකාරී නීති ඉවත් කිරීම මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම මෙන්ම ආබාධ සහිත ඡන්දදායකයින් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය යුරෝපා සංගම් මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම් අවසන් වාර්තාව මගින් තවදුරටත් අවධාරණය කරයි. *"ප්‍රජාතන්ත්‍රවාදය සමෘද්ධිමත් වන්නේ විනිවිදභාවය, අන්තර්ග්‍රහණය සහ නිදහස් ප්‍රකාශනය තුළිනි"* යැයි නිරීක්ෂක කණ්ඩායම් ප්‍රධානී සිය කතාව අවසන් කරමින් ප්‍රකාශ කළේය.

යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම් සභාව සහ ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් මැතිවරණ නිරීක්ෂණ කටයුත්තෙහි යොදවා ඇති අතර එය 2024 අගෝස්තු 14 දින සිට ඔක්තෝබර් 10 දින දක්වා රට පුරා ක්‍රියාත්මක විය.දිවයිනේ පළාත් නවයම ආවරණය කරමින් ජාත්‍යන්තර නිරීක්ෂකයින් 70 කට අධික සංඛ්‍යාවක් නිරීක්ෂණ කටයුතුවල නිරත විය.

වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර පහත QR කේතය පරිශීලනය හෝ පහත විද්‍යුත් ලිපිනයෙන් යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් මාධ්‍ය අංශය සම්බන්ධ කර ගන්න.

**මාධ්‍ය නිලධාරී, marek.mracka@eueomsrilanka2024.eu**

**සහකාර මාධ්‍ය නිලධාරී, rahul.vithanage@eueomsrilanka2024.eu**